#mediaethicsSL #SinhalaPress #lka #SundayMawbima
යම් කිසි පුවත් වාර්තාවක් සඳහා යොදාගන්නා රහස්‍ය මූලාශ්‍ර ජනමාධ්‍යවේදියා විසින් හැකි සෑම ලෙසකින්ම ආරක්ෂා කළ යුතු බව පිළිගත් මාධ්‍ය ආචාර ධර්මයකි. කෙසේ නමුත් තමන් යම් කිසි පුවත් වාර්තාවක් සඳහා භාවිතා කරනු ලබන මූලාශ්‍රයන් සඳහන් නොකිරීම සාමාන්‍ය භාවිත නොවිය යුතු අතර, එසේ මූලාශ්‍රයන් හෙළි නොකිරීම සිදුකළ යුත්තේ එම මූලාශ්‍රය විසින් එසේ හෙළි නොකරන ලෙසින් ඉල්ලා සිටිනා අවස්ථාවක හෝ වෙනත් එවන් සංවේදී අවස්ථාවක පමණක් විය යුතු බව ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වේ. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, හැකි සෑම විටකම තම පුවත් වාර්තාවන්ට පාදක වූ මූලාශ්‍රයන් සඳහන් කළ යුතු අතර, ඒ මගින් එම පුවත් වාර්තාවන්ගේ විශ්වාසනීයත්වය ඉහළ යයි.

ඉරිදා මව්බිම පුවත්පතේ 'ලංකාවේ මැතිවරණ කොමිසමට ඇමරිකාව රිංගයි' යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් කොට ඇති පුවත් වාර්තාව තුළද මූලාශ්‍රයන් කිසිත් ඉදිරිපත් කොට නැති අතර, එම තොරතුරු ලබාගෙන ඇත්තේ 'ආරංචි මාර්ග' ඔස්සේ යැයි සඳහන් වේ. මේ සම්බන්ධයෙන් ඇසීමට ඇත්තේ සරල පැනයකි. මෙසේ මූලාශ්‍ර සඳහන් කොට නොමැත්තේ, එම තොරතුරු ලබාදුන් රහස්‍ය මූලාශ්‍රය ආරක්ෂා කිරීම පිණිසද? එසේත් නැතිනම් එම ප්‍රවෘත්තියේ විශ්වාසනීයත්වය ගැටළුකාරී වන නිසාවෙන්ද?

See Less